**2025-03-24 දින පැවැත්වුණු අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී එළඹුණු තීරණ**

01. **දූෂණ විරෝධී ජාතික ක්‍රියාකාරී සැලැස්ම 2025 - 2029**

2023 අංක 9 දරන දූෂණ විරෝධී පනත මඟින් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ කාර්යභාරය, අල්ලස් හා දූෂණ සම්බන්ධ වැරදි විමර්ශනය කිරීමේ සහ නඩු පැවරීමේ සිට රට පුරා අල්ලස හා දූෂණය තුරන් කිරීම සඳහා දූෂණ විරෝධී ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සහ නියාමනය දක්වා පුළුල් කරනු ලැබ තිබේ. රජයේ "Clean Sri Lanka" වැඩසටහන ශ්‍රී ලාංකික සමාජයේ සදාචාරාත්මක සංවර්ධනයේ ඉහළ මට්ටමකට ඔසවා තැබීමට උත්සාහ දරන බැවින්, සියලුම අංශ ඇතුළත්ව ක්‍රියාත්මක වන ශක්තිමත් ජාතික දූෂණ විරෝධී ප්‍රතිපත්තියක් සකස් කර ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාව හඳුනාගනු ලැබ ඇත. එසේම, දූෂණයට එරෙහි එක්සත් ජාතීන්ගේ සම්මුතියෙහි නියම කර ඇති පරිදි ජාතික දූෂණ විරෝධී රාමුවක් සකස් කර ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාව මෙන්ම ජාත්‍යන්තර වශයෙන් පවතින ඇතැම් බැඳීම් ඉටු කිරීම සඳහා ද ශක්තිමත් දූෂණ විරෝධී රාමුවක් ක්‍රියාත්මක කළ යුතුව ඇත. දූෂණයට එරෙහි එක්සත් ජාතීන්ගේ සම්මුතියේ 5වන වගන්තිය යටතේ වන බැඳීම්වලට අනුකූලව ශ්‍රී ලංකාවේ අල්ලස හෝ දූෂණයට එරෙහිව පළමු ජාතික ක්‍රියාකාරී සැලැස්ම 2019-2023 කාලසීමාව තුළ ක්‍රියාත්මක කරනු ලැබ ඇත. එකී ක්‍රියාකාරී සැලැස්ම සමාලෝචනය කරමින්, දේශීය හා ජාත්‍යන්තර පාර්ශ්වකරුවන්ගේ සහභාගිත්වයෙන් 2025-2029 කාලසීමාව සඳහා නව දූෂණ විරෝධී ජාතික ක්‍රියාකාරී සැලැස්ම සකස් කර තිබේ. ඒ අනුව, අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, සියලුම රාජ්‍ය ආයතන සහ අදාළ පාර්ශ්වකරුවන් සමඟ සහයෝගයෙන් දූෂණ විරෝධී ජාතික ක්‍රියාකාරී සැලැස්ම - 2025-2029 ක්‍රියාත්මක කිරීම පිණිස ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

02. **ආසියාන් ආංශික සංවාද හවුල්කාරිත්වය (SDP)**

අග්නිදිග ආසියානු ජාතීන්ගේ සංගමය (ASEAN) අග්නිදිග ආසියාවේ රටවල් 10ක එකතුවෙන් සැදුම්ලත් දේශපාලන හා ආර්ථික සංගමයකි. එයට ලෝකයේ වේගයෙන්ම වර්ධනය වන ආර්ථිකයන් කිහිපයක් ඇතුළත් වන අතර එම රටවල් දළ වශයෙන් ගෝලීය දළ දේශීය නිෂ්පාදිතයෙන් 6.5%කට පමණ දායක වේ. ශ්‍රී ලංකාව මේ වන විට සියලුම ආසියාන් සාමාජික රටවල් සමඟ රාජ්‍යතාන්ත්‍රික සබඳතා පවත්වාගෙන යන නමුත් හවුල්කාරී ආර්ථික ප්‍රගතිය සඳහා ආසියාන් සමඟ ශක්තිමත් සම්බන්ධතාවක් අත්‍යවශ්‍ය වන බව ද පෙනී ගොස් ඇත. අග්නිදිග ආසියාවට අයත්

නොවන රාජ්‍යයන්ට ආසියාන් සාමාජිකත්වය ලබාගැනීමට නොහැකි වුවද, ආසියාන්හි අරමුණු සඳහා දායක වීමට ඇති හැකියාව මත පදනම්ව බාහිර රාජ්‍යයකට "ආංශික සංවාද හවුල්කරුවෙකු" ගේ තත්ත්වය පිරිනැමීමට ආසියාන් සංගමයට හැකියාව පවතී. ශ්‍රී ලංකාව 2019 වර්ෂයේදී ආංශික සංවාද හවුල්කාරිත්වය සඳහා අභිප්‍රාය ලිපියක් හා ආසියාන්හි අරමුණු ඉටු කර ගැනීම සඳහා යෝජනාවක් ආසියාන් ලේකම් කාර්යාලයට ඉදිරිපත් කර ඇති නමුත් ඒ සම්බන්ධයෙන් ඉදිරි පියවර ගෙන නොමැත. එබැවින්, බාහිර පාර්ශවයකට "ආසියාන්හි ආංශික සංවාද හවුල්කරුවෙකුගේ" තත්ත්වය ලබා ගැනීම සඳහා ආසියාන් විසින් දක්වා ඇති ක්‍රියාවලිය අනුගමනය කරමින් 2019 වර්ෂයේදී ඉදිරිපත් කරන ලද අභිප්‍රාය ලිපියට අදාළව පැහැදිලි කාලරාමු සහිත නව වැඩ/ක්‍රියාකාරකම් සැලැස්මක් ශ්‍රී ලංකාව විසින් ඉදිරිපත් කිරීම පිණිස විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

03. **සමූපකාර තොග වෙළෙඳ සංස්ථාව යළි සක්‍රීය කිරීම**

1949 අංක 47 දරන සමූපකාර තොග වෙළෙඳ සංස්ථා පනත පරිච්ඡින්න කර, එම ආයතනය ඇවර කිරීමට එවකට අමාත්‍ය මණ්ඩලය විසින් 2024-09-02 දින පැවැති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී තීරණය කරනු ලැබ ඇත. එහෙත්, "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" ප්‍රතිපත්ති රාමුවට අනුගතව වෙළෙඳපොළ තරගකාරිත්වය ප්‍රවර්ධනය කිරීම මගින් මහජනතාව වෙත ගුණාත්මක භාණ්ඩ හා සේවා සාධාරණ මිල ගණන් යටතේ අඛණ්ඩව සැපයීම සහතික කිරීමේ අරමුණින් වෙළෙඳපොළ මෙහෙයුම් තුළ රජයේ කාර්යභාරය ක්‍රියාත්මක කිරීම සඳහා සමූපකාර තොග වෙළෙඳ සංස්ථාවට තීරණාත්මක කාර්යභාරයක් ඉටු කිරීමට හැකියාව පවතී. එබැවින්, සමූපකාර තොග වෙළෙඳ සංස්ථාව ඇවර කිරීම සම්බන්ධයෙන් වන පූර්ව අමාත්‍ය මණ්ඩල තීරණය අවලංගු කර ශක්‍යතාවයෙන් යුත් ව්‍යාපාරික සැලැස්මක් මත පදනම්ව එම සංස්ථාවේ ව්‍යාපාරික කටයුතු නැවත ආරම්භ කිරීම පිණිස වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

04. **සපුගස්කන්ද විදුලි බලාගාරය වෙත ලිහිසි තෙල් සැපයීම සඳහා වන ප්‍රසම්පාදනය**

2025 මාර්තු මාසයේ සිට 2026 පෙබරවාරි මාසය දක්වා සපුගස්කන්ද විදුලි බලාගාරයේ ස්ථාපිත කර ඇති SEMT Pielstick PC 4.2 ඩීසල් එන්ජින් (A බලාගාරය) සඳහා සහ MAN B&W 8L ඩීසල් එන්ජින් (B බලාගාරය) සඳහා ලිහිසි තෙල් සැපයීමේ කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම සඳහා මෙහෙයුම් හා නඩත්තු අත්පොතෙහි දක්වා ඇති පරිදි මුල් උපකරණ නිෂ්පාදක විසින් නිර්දේශ කර ඇති සැපයුම්කරුවන්ගෙන් ලංසු කැඳවා තිබේ. ඒ අනුව, ඉහළ මට්ටමේ ස්ථාවර ප්‍රසම්පාදන කමිටුවේ නිර්දේශය මත

පදනම්ව A බලාගාරය සඳහා ලිහිසි තෙල් ලීටර 414,000ක් සැපයීමේ කොන්ත්‍රාත්තුව Lanka IOC PLC වෙත ප්‍රදානය කිරීමටත්, B බලාගාරය සඳහා ලිහිසි තෙල් ලීටර 389,000ක් සැපයීමේ කොන්ත්‍රාත්තුව Chevron Lubricants Lanka PLC වෙත ප්‍රදානය කිරීමටත් බලශක්ති අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

05. **1957 අංක 29 දරන විදේශ ණය පනත සහ එහි පසුකාලීන සංශෝධන අවලංගු කිරීම**

2024 අංක 33 දරන රාජ්‍ය ණය කළමනාකරණ පනත මඟින් විදේශ ණය ගැනීම් කළමනාකරණය කිරීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රියාපටිපාටි ආවරණය වන බැවින්, 1957 අංක 29 දරන විදේශීය ණය පනත සහ එම පනතට සිදු කරන ලද සියලු සංශෝධනයන් අවලංගු කළ යුතුව ඇත. ඒ සඳහා 2024-12-09 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී ප්‍රතිපත්තිමය එකඟතාව ලබා දී තිබේ. නීති කෙටුම්පත් සම්පාදක විසින් සකස් කරන ලද විදේශීය ණය (අහෝසි කිරීම) පනත් කෙටුම්පත සඳහා නීතිපතිගේ නිෂ්කාශනය ලැබී ඇත. ඒ අනුව, එකී පනත් කෙටුම්පත රජයේ ගැසට් පත්‍රයේ පළ කිරීමටත්, ඉන් අනතුරුව අනුමැතිය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමටත් මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

06. **1950 අංක 09 දරන ඉඩම් අත්කර ගැනීමේ පනත සංශෝධනය කිරීම**

දැනට බල පැවැත්වෙන 1950 අංක 09 දරන ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන අනුගමනය කිරීමේදී විශාල කාලයක් ගතවීම හේතුවෙන්, ඉඩම් අත් කර ගැනීමේ ක්‍රියාවලිය සඳහා ගත වන කාලය අවම කර, සරළ ක්‍රමවේදයක් යටතේ ඉඩම් අත්පත් කර ගැනීමටත්, ඒකීය ක්‍රමවේදයක් යටතේ වන්දි ගෙවීමටත් හැකි වන පරිදි, එම පනත වර්තමාන අවශ්‍යතාවන්ට ගැළපෙන අයුරින් සංශෝධනය කිරීමට 2021-01-11 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී ඇත. ඒ සඳහා වන මූලික පනත් කෙටුම්පත සකස් කර ඇති අතර එකී පනත් කෙටුම්පත සකස් කිරීමේ කටයුතු අවසන් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලයේ ප්‍රතිපත්තිමය අනුමැතිය ලබා ගත යුතු බව නීති කෙටුම්පත් සම්පාදක විසින් දැනුම් දී තිබේ. ඒ අනුව, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව සැලකිල්ලට ගෙන, එකී පනත් කෙටුම්පත කඩිනමින් සකස් කරන ලෙස නීති කෙටුම්පත් සම්පාදක වෙත උපදෙස් දීමට අමාත්‍ය මණ්ඩලය විසින් තීරණය කරන ලදී.

07. **1988 අංක 68 දරන පොහොර විධිමත් කිරීමේ පනත යටතේ පනවන ලද නියෝග පාර්ලිමේන්තුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම**

1988 අංක 68 දරන පොහොර විධිමත් කිරීමේ පනත යටතේ පොහොර ආනයනය, නිෂ්පාදනය හෝ සකස් කිරීම සඳහා බලපත්‍රයක් ලබා ගැනීමේදී ගෙවිය යුතු ගාස්තු අංක 1683/5 දරන 2010-12-06 දිනැති අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග මඟින් ප්‍රකාශයට පත් කර ඇත. එකී නියෝග මඟින් ප්‍රකාශිත ගාස්තු කාලානුරූපව සංශෝධනය කිරීම සඳහා 2024-02-05 දින පැවැති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී තිබේ. ඒ අනුව, නීති කෙටුම්පත් සම්පාදක විසින් සකස් කරනු ලැබ ඇති නියෝග අංක 2398/13 දරන 2024-08-20 දිනැති අති විශෙෂ ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශයට පත් කර ඇත. 1988 අංක 68 දරන පොහොර විධිමත් කිරීමේ පනතේ විධිවිධාන ප්‍රකාරව එකී නියෝග අනුමැතිය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම පිණිස කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

08. **2007 අංක 07 දරන සමාගම් පනත සංශෝධනය කිරීම**

මුදල් විශුද්ධිකරණය, ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම සහ අනෙකුත් අනීතික ක්‍රියාකාරකම් මැඩපැවැත්වීම සඳහා ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව නෛතික පුද්ගලයන්ගේ අර්ථලාභී අයිතියෙහි පාරදෘශ්‍යභාවය ආශ්‍රිත ඌනතාවන්ට පිළියම් යෙදීම සඳහා 2007 අංක 07 දරන සමාගම් පනත සංශෝධනය කිරීම පිණිස අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව, නීති කෙටුම්පත් සම්පාදක විසින් සකස් කරන ලද පනත් කෙටුම්පත අංක SC/SD/92/2024 දරන ශ්‍රේෂ්ඨාධිකරණයේ විශේෂ තීන්දුව මත පදනම්ව නීතිපති විසින් ලබා දෙන ලද උපදෙස් පරිදි නැවත සංශෝධනය කරනු ලැබ ඇත. ඒ අනුව, නීති කෙටුම්පත් සම්පාදක විසින් සකස් කරනු ලැබ ඇති අවසන් පනත් කෙටුම්පත සඳහා නීතිපතිගේ නිෂ්කාශනය ලැබී තිබේ. එකී පනත් කෙටුම්පත රජයේ ගැසට් පත්‍රයේ පළ කිරීමටත්, ඉන් අනතුරුව අනුමැතිය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමටත් වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

09. **1978 අංක 01 දරන ටවර් හෝල් රඟහල පදනම පනත සංශෝධනය කිරීම**

1978 අංක 01 දරන ටවර් හෝල් රඟහල පදනම පනත සංශෝධනය කිරීම සඳහා 2023-03-21 දින පැවැති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව සකස් කරනු ලැබ ඇති පනත් කෙටුම්පත සඳහා වත්මන් අමාත්‍ය මණ්ඩලයේ එකඟතාව ලබාගත යුතු බව නීති කෙටුම්පත් සම්පාදක විසින් දන්වා තිබේ. ඒ අනුව,

1978 අංක 01 දරන වෝටර් හෝල් රඟහල පදනම් පනත සංශෝධනය කිරීම සඳහා ප්‍රතිපත්තිමය අනුමැතිය ලබා දීම පිණිස බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

10. "කාලීන ආහාර පැකේජය" ලබා දීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම

සිංහල හා දෙමළ අලුත් අවුරුදු සමය තුළදී සහන මිලකට අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය පැකේජයක් ලබා දීම සඳහා ගරු ජනාධිපතිතුමා විසින් 2025 අයවැය යටතේ ඉදිරිපත් කරන ලද යෝජනාව අනුව රුපියල් 5,000/-ක වටිනාකමකින් යුත් අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය ඇතුළත් "කාලීන ආහාර පැකේජයක්" රුපියල් 2,500/-ක සහන මිලකට ලබා දීමට සැලසුම් කර ඇත. ඒ සඳහා අස්වැසුම ප්‍රතිලාභ අපේක්ෂාවෙන් අලුතින් අයදුම්පත් ඉදිරිපත් කරනු ලැබ ඇති 812,753ක් වන අයදුම්කරුවන් අතුරින් යෝග්‍ය ප්‍රතිලාභීන් තෝරා ගැනීමට අපේක්ෂා කරනු ලබයි. ඒ අනුව, 2025-04-01 දින සිට 2025-04-13 දින දක්වා කාලය තුළ රටපුරා පිහිටි ලංකා සතොස අලෙවිසැල් ජාලය සහ COOPFED අලෙවිසැල් මඟින් ආහාර පැකේජය ප්‍රතිලාභීන් වෙත ලබා දීම පිණිස අවශ්‍ය පියවර ගැනීම සඳහා කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා සහ වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍යතුමා ඉදිරිපත් කළ ඒකාබද්ධ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

11. රාජ්‍ය සේවයේ වැටුප් සංශෝධනය - 2025

2025 අයවැය මඟින් රාජ්‍ය සේවයේ වැටුප් සංශෝධනය කිරීම සඳහා ගරු ජනාධිපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව මත පදනම්ව 2025-04-01 දින සිට ක්‍රියාත්මක වන පරිදි සංශෝධිත වැටුප් පරිමාණයන්ට අනුව වැටුප් ගෙවීම සඳහා වන විධිවිධාන ඇතුළත් චක්‍රලේඛ උපදෙස් නිකුත් කිරීම සම්බන්ධයෙන් මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා සහ රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා සැලකිල්ලට ගෙන අමාත්‍ය මණ්ඩලය විසින් පහත සඳහන් පරිදි තීරණය කරන ලදී:

* රාජ්‍ය සේවයේ වැටුප් සංශෝධනයට අදාළව සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්, පළාත් ප්‍රධාන ලේකම්වරුන් සහ දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත චක්‍රලේඛ උපදෙස් නිකුත් කිරීම පිණිස රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් වෙත බලය පැවරීම.

* රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල හා සම්පූර්ණයෙන් රජය සතු සමාගම් සහ අනෙකුත් අදාළ ආයතනයන් සඳහා වන චක්‍රලේඛ උපදෙස් නිකුත් කිරීම පිණිස මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථීක සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් වෙත බලය පැවරීම.

*************